# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2327/06 - 2023 අප්‍රේල් මස 11 වැනි අඟහරුවාදා - 2023.04.11

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

මගේ යොමු අංකය : KDS/PDB/4/3/2/25.

ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය : 4-3/18/2019/ws/622.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට රජය අදහස් කරන බැව්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර* :

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, පාතදුම්බර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පල්ලේගම්පහ කෝරළේ සුළු කොට්ඨාසයේ, බෝගහකුඹුර ගමේ පිහිටි, සර්වේයර් ජනරාල් වෙනුවට මහනුවර ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරී විසින් මැන පිළියෙළ කරන ලද අංක 321091 දරන කැඩැස්තර සිතියමෙ කැබලි අංක 1 වශයෙන් දැක්වෙන මුළු ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0025ක් පමණ වූ පහත සඳහන් මායිම් තුළ පිහිටි ඉඩම් කොටස :

**කැබලි අංක 1**

ඉඩමේ නම : වූඩ්තෝප් වත්ත; හිමිකම් කියන්නන්ගේ නම් හා ලිපිනයන් : රජය; මුල් හිමිකම් පාන්නා: ඒ. ආර්. එම්. එන්. රත්නායක, අංක 52/2, බෝගහකුඹුර, ජම්බුගහපිටිය; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0025.

*උතුරට*: බෝගහකුඹුර (කොටසක්); *නැගෙනහිරට*: බෝගහකුඹුර (කොටසක්); *දකුණට*: බෝගහකුඹුර (කොටසක්) ; *බටහිරට*: බෝගහකුඹුර (කොටසක්).

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2023 ජූනි මස 19 වැනි දින පෙ.ව. 10.00ට පාතදුම්බර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී මා සම්මුඛ විය යුතුය.

තවද, 2023 ජූනි මස 05 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය. හිමිකම් කීම පිළිබඳ ඔප්පු ආදිය පරීක්ෂණයේදී ඉදිරිපත් කළ යුතුය.

**ඩබ්. එම්. ටී. ඩී. කේ. වීරකෝන්,**
ප්‍රාදේශීය ලේකම්,
පාතදුම්බර.

2023 අප්‍රේල් මස 06 වැනි දින,
පාතදුම්බර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 04 - 0080